Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## විශ්වවිද්‍යාල රෝහල

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **විශේෂඥ වෛද්‍ය නිලධාරි :**

- විශේෂඥ වෛද්‍ය නිර්වින්දන (හෘද සහ උරස් ශල්‍ය කර්ම නිර්වින්දනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.)
- විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍ය
- විශේෂඥ වෛද්‍ය දූඩිසත්කාර
- විශේෂඥ වෛද්‍ය චර්ම රෝග
- විශේෂඥ වෛද්‍ය විද්‍යුත් භෞතවේද හෘද රෝග
- විශේෂඥ වෛද්‍ය ලිංගාශ්‍රිත රෝග
- විශේෂඥ වෛද්‍ය හදිසි ප්‍රතිකාර
- විශේෂඥ වෛද්‍ය වකුගඩු රෝග
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය වාහිණික සහ අවයව බද්ධ කිරීම්
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය උගුර, කන, නාසය
- විශේෂඥ වෛද්‍ය ක්‍රීඩා
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය හෘද සහ උරස් සැත්කම්
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය මුඛ, හනු, මුහුණු
- විශේෂඥ වෛද්‍ය ළමා හෘද රෝග
- විශේෂඥ වෛද්‍ය දත්ත සංරක්ෂණ
- විශේෂඥ වෛද්‍ය අධිකරණ
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය ප්ලාස්ටික් සැත්කම්
- විශේෂඥ වෛද්‍ය විකිරණ

*සුදුසුකම් :*

i. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය;

හෝ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම;

සහ

iii. විශේෂඥ වෛද්‍ය (MD/MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* I වන ඇමුණුම);

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MC 1-2-රු. (91,645 - 12 x 2700 - රු. 124,045)

02. **වෛද්‍ය නිළධාරි - I ශ්‍රේණිය**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම ;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමක කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරණ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 -රු. 99,015)

* වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585

03. **දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරි - I ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක II වන ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර නවයක (09) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරණ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1910 - 10 x2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585

04. **වෛද්‍ය නිළධාරි - II ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 5 හි තබනු ලැබේ. - රු. 64,185

05. **දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරි - II ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 1 හි තබනු ලැබේ. - රු. 58,675

06. **වෛද්‍ය නිළධාරි - ප්‍රාථමික ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 2 හි තබනු ලැබේ. - රු. 60,050

**පොදු කොන්දේසි**

සෑම ඉල්ලුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

v. මෙම තනතුරු ස්ථිර වන අතර වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය යන තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවෙහි නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

vi. විශේෂඥ වෛද්‍යවරුන් වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ගේ ඉගැන්වීම් සහ පුහුණුවීම් කටයුතුවලටද පශ්චාත් වෛද්‍ය අධ්‍යාපන කටයුතුවලටද දායක විය යුතු අතර මෙම කාර්‍යය වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මග පෙන්වීම යටතේ සිදුකල යුතුය.

vii. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක් ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද, දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව),

viii. දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කල යුතුය.

ix. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල සතුවේ.

x. ඉල්ලුම්පත්‍ර සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2020.09.30 දිනට පෙර ''විධායක අධ්‍යක්ෂක, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල, වේරහැර'' යන ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පතෙහි ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

xi. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

xii. අයදුම්පත්‍ර සහ අදාල අනෙකුත් විස්තර බාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.
www.kdu.ac.lk

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න,
ඩබ්ඩබ් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව
විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති.